## රැකියා ප්‍රස්ථා වැඩිකරලන

# උඩවැඩියා හා ඇන්තූරියම් වගාව

**ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් සඳහා රැකියා ප්‍රස්ථා වැඩි කරලීම වර්තමාන රජයේ පළමුවන දෙවන මෙන් ම තුන් වන ප්‍රමුඛතාවය ද වේ. විදේශීය වෙළඳ පොළෙහි නිවර්තික මල් වර්ගවලට ඇති ඉල්ලුම සපුරාලීමට අපද උඩවැඩියා හා ඇන්තූරියම් වගා කිරීමෙන් රැකියා රැසක් බිහිවන අතර, විශාල විදෙස් ධන සම්පත්තියක් මෙරටට ඇද ගත හැකිවනවා ඇත.**

මල් ලස්සනත්, ආදරයත්, මුදු බවත්, මූර්තිමත් කරන සංකේතයක්. ශ්‍රී ලංකා වාසීන් මල් ඇසුරු කලේ අවුරුදු දහස් ගණනක සිට යි.

### අතීතයේදී

අශෝක රජු සමයටත් පෙර මෙරටට පැමිණි ඉන්දු ආර්යයන් පුද පූජා උදෙසා මල් භාවිතා කළා. බුදු දහම මෙරටට පැමිණියායින් පසුව බෞද්ධ ආරාම, වෙහෙර විහාර ආශ්‍රිත පුද බිම්වල විශාල වශයෙන් මල් වගා කිරීමට රජවරු පවා උත්සුක උනා මහාවංශයේ සඳහන් වන අන්දමට මෙරට පැරණිම මල් උයන ඇති කලේ ක්‍රි. පූ. 307 සිට 247 දක්වා රජ කළ මුටසිව රජ විසින්. එය අනුරාධපුරයේ පිහිටවූ



පේරාදෙනියේ උද්භිත උද්‍යානයේ බෝකරන උඩවැඩියා පැල 'කොමපොට්' බඳුන්වල.

මහාමේඝ වන උද්‍යානය යි. මෙහි අඹ, සල්, සපු, නා, පනා, ඇහැල, අශෝක, සමන්පිච්ච ආදිය වගා කළා. මේ වගේම 12 වන සියවසේ මහාපරාක්‍රමබාහු රජතුමා උයන් 28 ක් තම රාජධානිය තුළ ඇති කළ බව ඉතිහාසයේ සඳහන් වෙනවා.

ඊළඟට වැදගත් වන්නේ බ්‍රිතාන්‍ය යුගයයි. මෙම කාලය සලකන විට පේරාදෙණිය, හග්ගල සහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යාණය පිහිටුවීම මෙරට අලංකාර මල් වරග වැවී මේ වැදගත් පියවරක් බව පෙනී යනවා. මෙවාහි මල වැඩිමනත්ම වගා කලේ සෞන්දර්යාත්මක අගය උදෙසායි. මේ අතර උඩරට තේ හා කෝපි වැවිලිකරුවන් ප්‍රදර්ශන උදෙසාත්, කැපූ මල් විකිණීම උදෙසාත්, රෝස, කානේෂන්, ඩේලියා, ග්ලැඩියොලාස් වැනි මල් වර්ග වැවීමට උනන්දුවූ අතර මේවා කෙටි කාලයකින් උඩරට ප්‍රදේශවල ඉතාමත් ජනප්‍රිය ගෙවතු මල් වගා බවට පත් උනා.

## වෙළඳ පොලක් බිහිවීම

කාලයාගේ ඇවෑමෙන් මල් හුදෙක් පුද පූජාවලට සීමා නොවී විවිධ සමාජයයි උත්සව කටයුතු උදෙසාත් භාවිතා වන්නට පටන් ගත්තා. ඒ නිසා ක්‍රමයෙන් මල් අත්‍යාවශ්‍ය දෙයක් බවට පත් වන්නට පටන් ගත් විට මල් සඳහා වැඩි ඉල්ලුමක් රට තුළ ඇති උනා. මෙහි දී නුවරඑළිය හා ඒ ආසන්න ප්‍රදේශවල වෙළඳ පොලට මල් සපයන කුඩා ගෙවතු මල් කොටු බිහි වන්නට පටන් ගත්තා. ඇත්ත වශයෙන් ම ඒ කාලයේ ලංකාවේ හැම කෙනෙක් ම මල් ගැන කල්පනා කරන විට හිතුවේ නුවරඑළිය හා ඒ ආසන්න ප්‍රදේශ ගැන යි.

## උඩවැඩියා හා ඇන්තූරියම්

පේරාදෙණියේ උද්භිද උද්‍යානය 1950 ට පෙර ඇන්තූරියම් මල් වර්ග වගා කලේ හුදෙක් අලංකාරය උදෙසා ය. ඇත්තවශයෙන් ඒ කාලයේ ඇන්තූරියම් වල ඇති වෙළඳ අගය ගැන අපට එතරම් වැටහීමක් තිබුනේ නැහැ. නමුත් 1950 වන විටත් හවායි දූපත්වල ඇන්තූරියම් වගාව විනෝදාංශ තත්වයෙන් ඉවත්ව වැදගත් අපනයන කර්මාන්තයක් හැටියට ඇති වෙමින් පැවතුනා. මෙය ආදර්ශයට ගනිමින් පේරාදෙණිය උද්‍යානයත් මේ පැල ස්වල්පයක් ඒ රටවලින් ගෙන්වා ගෙන බෝ කර පැල බෙදහැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළා. මේ අන්දමින් 1965 වන විට මෙම පැල මල් වගා කරුවන්ට බෙද දී මේ ව්‍යාපාරය පුළුල් වශයෙන් කරන්නට හැකි උනා.

උඩවැඩියා මල් වගාව සම්බන්ධයෙන් සලකන විටත් මෙරට අවුරුදු හතළිහක පණහක පමණ කාලයක් තිස්සේ පැවතුනේ විනෝදාංශයක් හැටියටයි. ඒ සඳහා ම කැප වුන ස්වල්ප දෙනෙක් කර ගෙන ගිය මෙම ව්‍යාපාරයෙන් ඔවුන් උත්සාහ කලේ ප්‍රදර්ශනය උදෙසා ලස්සන උඩවැඩියා මල් බිහි කිරීමට යි.


මේ අය වැඩි දෙනෙක් පෝසත් උදවිය නිසා ඔවුනට ඒ සඳහා වියදම් දැරීමේ තත්වයක් ද තිබුණා. කොහොම උනත් මොවුන්ට ලෝකයේ ඉතාම ලස්ස උඩ වැඩියා මල් වර්ග කිහිපයක් ම අභිජනනය කරන්නට හැකි උනා. මේ නිසා උඩ වැඩියා මල් වැවීම පිළිබඳ විද්‍යාත්මක දැනීමක් රටේ තිබුනේ මේ ස්වල්ප දෙනා අතරේ පමණයි. පේරාදෙණිය උද්භිද උද්‍යානයේ උඩවැඩියා මල් වගාව 1951 සිට කර ගෙන ආවත් මෑතක් වන තුරු එය සිදු කලේ ප්‍රදර්ශන තත්වයේ මල් බිහි කිරීමට යි. 1970 මුල් භාගයේ දී ජර්මන් ආධාර ක්‍රමයක් යටතේ පේරාදෙණිය උද්භිද උද්‍යානය උසස් ආරවල උඩ වැඩියා මවු පැල ගෙන්වීමටත්, රසායනාගාරය දියුණු කිරීමටත්, රුපියල් ලක්ෂ 10 ක් පමණ මුදලක් ලබා ගෙන කටයුතු කළා. 1974 සිට මෙහි බිහි කළ උඩවැඩියා මල් පැල ලියා පදිංචි වූවන් අතර බෙද හැරීමට ද කටයුතු කර ගෙන යනවා.

## ජෙට් ගුවන් යානවලින් මල් ප්‍රවාහණය

දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් වීමත් සමඟ ම වාගේ අන්තර් ජාතික ජෙට් ගුවන් ගමන් සේවය ඇරඹීම නිවර්තනික

රටවල කැපූ මල් ව්‍යාපාරය බිහි කරලීමට සිදු වූ වැදගත් ම කරුණක්. මේ නිසා උඩවැඩියා සහ ඇන්තූරියම් මල් සඳහා විමසීම් ශ්‍රී ලංකාවේ විදේශීය තානාපති කාර්යාලවලට ද ලැබුණා. මේ නිසා ඇති වූ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවේ කැපූ මල් ව්‍යාපාරයක් බිහි කිරීමට සුදුසු වාතාවරණයක් ඇති උනා.

1960 ගණන්වල අවසාන භාගයේ දි මෙරට විදේශීය වෙළඳ පොල උදෙසා කැපූ මල් ව්‍යාපාරයක් බිහි කිරීමේ සාධ්‍යතාව සොයා බැලීමට කමිටුවක් පත් කරන්නට



ඩී. ටී. ඒකනායක මහතා

යෙදුනා. ඒ කමිටුවේ නිර්දේශ හේතුකොට ගෙන 1969 පටන් කැපූ මල් අපනයනය සඳහා වවන්නන් දිරි ගැන්වීම රජයේ වැදගත් ප්‍රතිපත්තියක් හැටියට සැලකෙනවා.

## යුරෝපයේ අවශ්‍යතා

මල් භාවිතාවත්, උසස් ජීවන මට්ටමත් අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් තිබෙනවා යයි සඳහන් කරන්නට පුළුවන්. විශේෂයෙන් මල් සුඛෝපභෝගී භාණ්ඩයක් හැටියට සැලකෙන නිසා ඒවා විශාල වශයෙන් භාවිතා කරන්නේ ඉහළ ජීවන මට්ටමක් ඇති බටහිර යුරෝපා රටවලත්, ජපානය හා ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවලත් ය. මේ රටවල විවිධාකාර සමාජ සිරිත් විරිත් උත්සව සඳහා මල් භාවිතා කෙරෙනවා. මෙහි දී විශේෂයෙන් නත්තල් හා පාස්කු උත්සවත් ඒවගේ ම ජර්මන් ජාතිකයින් ගේ මව්වරුන් ගේ දිනයත් සඳහන් කරන්නට පුළුවන්. ජර්මන් ජාතිකයින් ඔවුන් ගේ මව්වරුන් ගේ දිනයේ දි හැම කෙනෙක් ම තම මවට මල් කළඹක් දී ගරු සරු කරනවා. කෝටි 40 ක පමණ ජනතාවක් සිටින ජර්මන් රටේ හැම කෙනෙකුම තම මවට මල් කළඹක් බැගින් දීමට යාමේ දී කොපමණ මල් ප්‍රමාණයක් උවමනා වනවාද යන්න අපට හිතා ගන්න පුළුවන්.

**මෙරට වාණිජමය පදනමක් යටතේ උඩවැඩියා හා ඇන්තූරියන් මල් වැවීම ව්‍යාප්ත කිරීමෙහි ලා පුරෝගාමීව කටයුතු කල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පේරාදෙණියේ උද්භිද උද්‍යානයේ, අධිකාරී, ඩී. ටී. ඒකනායක මහතා සමග කළ සාකච්ඡාවකිනි.**

යුරෝපීය රටවල්වල දේශගුණය බලන විට කැපී පෙනෙන ශීත හා උෂ්ණ කාලවල් තිබෙනවා. උෂ්ණ කාලවල ඒ රටවල්වල අයට අවශ්‍ය කානේෂන්, ටියුලිප් වැනි මල් වර්ග නිපදවා ගැනීමට පුළුවනි. නමුත් සැප්තැම්බර්යේ සිට මාර්තු දක්වා පවතින ශීත කාලයේ එම මල් පැල වගා කරන්නට බැහැ. වවනවා නම් වැවිය හැක්කේ වියදම් සහිත වීදුරු ගෙවල් වල පමණයි. මේ නිසා ඔවුන් හට පිටරටින් මල් ගෙන්වා ගැනීම ලාබයි. අපි නිපදවන්න ඕනෑ මේ කාලයට

ඔවුන්ට අවශ්‍ය උඩවැඩියා හා ඇන්තුරියම් මල්. මේ කාලයේ අපි නිපදවන ඕනෑම මල් ප්‍රමාණයක් ඒ රටවල් මිළ දී ගන්නට සූදනම්.

## තායිලන්තය හා සිංගප්පූරුව

අද මේ රටවල අවශ්‍යතාවයන් ප්‍රධාන වශයෙන් සපුරා ලන්නේ දකුණු ඇමරිකානු රටවලුත් හා ආසියාතික රටවලුත් ය. ලෝක සංග්‍රාමය අවසාන වූ කාලයේ ම වෙළඳ පොලට මල් යැවීමට කැපූ මල් ව්‍යාපාරයක් පටන් ගත් තායිලන්තය අද මුල් ස්ථානය ගන්නවා. ඔවුන් සතු විද්‍යාත්මක දැනීම උසස් වර්ගයේ මල් බිහි කිරීමට බෙහෙවින් ප්‍රයෝජනවත් වී තිබෙන අතර, 1976 දී ඒ රට ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 7 කට වඩා වටිනා උඩවැඩියා මල් යුරෝපාදී රට වලට විකුණා තිබුණා. ඊළඟට තැන ලැබෙන්නේ සිංගප්පූරුවට යි. අනතුරුව මැලේසියාව සහ ශ්‍රී ලංකාව ද සඳහන් කරන්න පුළුවන්. අපේ රටේ ඇති මල් නිෂ්පාදනය ගැන කියනවා නම් කියන්නට තිබෙන්නේ එය දේශීය වෙළඳ පොලේ අවශ්‍යතාවය පිරිමැසීමටවත් ප්‍රමාණවත් නොවන බව යි.

## ශ්‍රී ලංකාව

කොහොම උනත් ශ්‍රී ලංකාව තරම් උඩවැඩියා සහ ඇන්තුරියම් මල් වැවීමට හොඳ රටක් ලෝකයේ කොහේ වත් නැති තරම් යයි කියල කියන්නට පුළුවන්. දේශගුණය අතින් බලන කළ පහත රට තෙත්කලාපය මීට වඩා සුදුසු යි. උතුරෙන් හලාවතත්, දකුණෙන් මාතරත්, රට මැදට කෑගල්ලත් ඇති ප්‍රදේශත්, ඊළඟට පේරාදෙණිය, මහනුවර සහ මාතලේ පිහිටි මැදරට ප්‍රදේශත් මෙ සඳහා සුදුසු යි. මැදරට ප්‍රදේශය වඩා සුදුසු වන්නේ ඇන්තුරියම් සහ ස්ට්‍රැප් වැන්ඩා වැනි උඩවැඩියා වර්ග වගාවටයි, තෙත්කලාපය තුළ වුවත් අධික වර්ෂාව නිසා රත්නපුර හා කළුතර දිස්ත්‍රික්ක උඩවැඩියා මල් වගාවට එතරම් ම සුදුසු නැහැ. කෙසේ උනත් මෙ දිස්ත්‍රික්ක දෙක උඩවැඩියා අභිජනනය කිරීම කුඩා මල් ගොවි පලවල්වල කරන්නටත් පුළුවන්.

පිටරට යැවීම උදෙසා මල් වැවීමේ ව්‍යාපාරයක් කිසිවෙකු ආරම්භ කරනවා නම් එය සෑහෙන පුළුල් ව්‍යාපාරයක් හැටියට කළයුතු යි. ඊට හේතුව සෑම සතියකටම වරක් මල් තොග වශයෙන් පිටරට යැවීමට හැකි වන පරිදි නිෂ්පාදනයක් පවත්වා ගෙන යායුතු නිසා යි. එම නිසා අක්කර කිහිපයක වත් එම මල් වගාව කළයුතු වෙනවා. කෙසේ උනත් සුළු වශයෙන් උඩවැඩියා හා ඇන්තුරියම් මල් වවන අයට උඩවැඩියා හා විචිත්‍ර පැලෑටි වවන්නන් ගේ සමුපකාර සමිතිය (ලක්මල් යාය) බඳු නිෂ්පාදකයින් ගේ සමුපකාර සමිති වලට බැඳී කටයුතු කරන්නට පුළුවන්.

## වාණිජමය අතින් ප්‍රයෝජනවත් වගාවක් පිහිටුවීම

මෙරට පැවති බොහෝ උඩවැඩියා වර්ගවලින් අවුරුද්දකට ලබා ගත හැකි වූයේ මල් කිනිති එකක්පමණයි. වාණිජමය අතින් ප්‍රයෝජනවත් වගාවක් පිහිටුවීමේ දී අඩුම වශයෙන් එක උඩවැඩියා ගසකින් අවුරුද්දකට මල් කිනිති හයක්වත් ලබා ගැනීමට කටයුතු කළයුතු යි. දැන් විද්‍යානුකූල ක්‍රම අනුසාරයෙන් අවුරුද්දකට මල් කිනිති 50ක් දක්වා ගත හැකි උඩවැඩියා පැල අභිජනනය කර තිබෙනවා.

අනික් කරුණ සෑම උඩවැඩියා මලක්ම පිටරට යවන්නට බැහැ. ඒ සඳහා ප්‍රමිති තිබෙනවා. ඒවගේම සුදුසු වර්ග තිබෙනවා. මල් ඇහිරීමේ ක්‍රමත් තිබෙනවා. ඒවගේම මල් අසුරන පෙට්ටි, ද්‍රව්‍ය යනාදියෙන් පිළිවෙළක් තිබෙනවා. මේ හැම කරුණක් ගැනම හොඳ දැනීමක් තිබිය යුතු යි.

උඩවැඩියා හා ඇන්තුරියම මල් වැවීමේ දී ප්‍රවාහන පහසුකම් ගැන සැලකිලිමත්වීම ඉතා වැදගත්. ඊට හේතුව පැය 24 ක් ඇතුළත කැපූ මල් ගුවන් මගින් යුරෝපීය වෙළඳ පොලවලට ලැබෙන්නට සැලැස්විය යුතු නිසා යි. මෙ හේතුව කොළඹ දිස්ත්‍රික්කයේ කටුනායක ගුවන් තොටුපල යාබද පෙදෙස්වල මෙම ව්‍යාපාරය ඉක්මණින්

පුළුල් වී යාමට හේතු වී තිබෙනවා. එයින් ප්‍රවාහනයට වැය වන මුදල ද අඩු කර ගත හැකි වෙනවා.

කැපූ මල් ව්‍යාපාරය පවුලේ ව්‍යාපාරයක් හැටියට පවත්වා ගැනීම වඩාසුදුසු යයි සඳහන් කරන්නට පුළුවන්. විශේෂයෙන් පලුදු නොමැති උසස් තත්වයේ මල් නිපද වීම කළයුතු වන නිසා කැපවීමකින් යුතුව මෙම ව්‍යාපාරයෙහි නිරතවීම වැදගත්. අද නාත්තන්ඩියේ පිහිටුවා ඇති ලංකාවේ විශාලතම උඩවැඩියා සහ ඇන්තූරියම් මල් වැවීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යන්නේ පවුලේ ව්‍යාපාරයක් හැටියට යි. එහි අයිති කරුවන් ගේ පවුලේ හැම කෙනෙක් ම දිවා රාත්‍රී වෙහෙස වී එහි කටයුතු කරගෙන යනවා.

අවසාන වශයෙන් මල් අපනයනය කිරීමේදී රේගුව ආදී ස්ථානවල පමා වන්නට නොදී ඉක්මණින් පිටරට පැටවීම වැදගත් කරුණක්. මෙහි දී අපට තායිලන්තය සහ සිංගප්පූරුව බඳු රටවල් ආදර්ශයට ගත හැකි වෙනවා. එම රටවල කැපූ මල් පිටරට පැටවීමේ දී රේගු නීති රෙගුලාසි අනුව කටයුතු ඉටු කිරීම ඉක්මණින් අවසන් කළ හැකි වන පරිදි වෙනස් කිරීමෙන් කැපූ මල් අපනයනය දිරි ගන්වා තිබෙනවා. ශ්‍රී ලංකාවේත් මේ වගේ සහන මල් අපනයන කරුවන්ට ලැබෙන්නට සැලැස්වීම ඔවුන් ගේ කටයුතු දිරි ගැන්වීමට හේතු වෙනවා නොඅනුමානයි.

# අළුත් කැට පෝරක්

කලින් මූලික පෝරක් වශයෙන් නිර්දේශ කරන ලද වී. 1 සහ වී. 3 ගොයම් පෝර මිශ්‍රණයක් වෙනුවට 3.30.10 යනුවෙන් හඳුන්වන අළුත් එන්. පී. කේ. කැට පෝර මිශ්‍රණයක් දැන් ලංකා පෝර සංස්ථාව මගින් නිකුත් කරනු ලැබේ.

මෙම 3.30.10. නම් කැට පෝර මිශ්‍රණය, වියළි කලාපයේ කුඹුරු වලට වී. 1 වෙනුවට ද, පොස්පරස් ඌණ පසින් යුත් කුරුණෑගල හා රත්නපුර දිස්ත්‍රික්කයේ කුඹුරුවලට වී. 3 වෙනුවට ද යෙදිය හැක.

වී. 1 සහ වී. 3 පෝර මිශ්‍රණ මින් මතුවට මෙම ප්‍රදේශවල අලෙවි නොකෙරෙනු ඇත. ඒ වෙනුවට මින් ඉදිරියට නිකුත් කෙරෙනුයේ 3.30.10 කැට පෝර පමණකි. මෙම නව කැට පෝරවල වී. 1 සහ වී. 3 මිශ්‍රණවල අඩංගු පෝෂ්‍ය ගුණයට සමාන පෝෂ්‍ය ගුණයක් අඩංගු වනු ඇත.